දේවි බාලිකා විද්‍යාලය - කොළඹ
Devi Balika Vidyalaya - Colombo

පළමු වාර පරීක්ෂණය - 2012
First Term Test - 2012

බුද්ධ ධර්මය

10 ශ්‍රේණිය

පැය 1 1/2

නම : ..............................................................

විභාග අංකය : ..................

* ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01) ත්‍රිලක්ෂණයෙහි අනිත්‍ය යනුවෙන් අදහස් වනුයේ,
1. වෙනස්වීමේ හේතුවෙන් ඇතිවන දුකයි
2. සියල්ලෙහි වෙනස්වන ස්වභාවයයි
3. නොවෙනස් වන හරයක් හෝ ආත්මයක් නැතිබවයි
4. සියල්ල සදාකාලික වන බවයි.

02) ඇස , කණ , නාසය , දිව , ශරීරය හා මනස යන ආයතන හයට ගෝචරවන අරමුණු හඳුනා ගන්නේ,
1. රූපස්කන්ධයෙනි
2. සඤ්ඤාස්කන්ධයෙනි
3. වේදනාස්කන්ධයෙනි
4. සංඛාර ස්කන්ධයෙනි

03) අනත්තලක්ඛණ සූත්‍රය දේශනා කළේ
1. ජටිල භික්ෂූන්ට
2. උපක ආජීවකයාට
3. පස්වග මහනුන්ට
4. දේවානම්පියතිස්ස රජුට

04) මෛත්‍රී භාවනාව වැඩීමේ අනුසස්,
1. එකොළහකි
2. විසිහතරකි
3. දහයකි
4. හයකි

05) සාංසාරික ජීවිතයේ කවර අවස්ථාවකදී හෝ විපාක ලැබෙන කර්ම
1. දිට්ඨධම්ම වේදනීය කර්ම
2. උපපජ්ජවේදනීය කර්ම
3. උපපීලක කර්ම
4. අපරාපරියවේදනීය කර්ම

06) උතුනියාම යනුවෙන් අදහස් වන්නේ,
1. අද්භූත ධර්මයේ පෙනෙන කරුණුය
2. කාලගුණික දේශගුණික වෙනස්කම් වලට අනුව වන ස්වාභාවික වෙනස්වීම්ය
3. බීජයකට අනුව ඵලය හට ගැනීමයි
4. සිතෙහි ක්‍රියාකාරීත්වයයි

07) පටිච්ච සමුප්පාදය යනු,
1. මෙහි හට ගැනීමෙන් මෙය හට නොගැනීමයි
2. ඵලය හා හේතුව දෙකම එකම වීමයි
3. හේතු සාධක පවත්නා කල්හි ඵලයක් ඇතිවීමයි
4. හේතුවක් නැතිව ඵලය ඇතිවීමයි

08) බුද්ධත්වයෙන් හයවන සතියේ සිදුවූ වැදගත් සිදුවීම වන්නේ,

1. මුචලින්ද නා රජු සෙවන ලබාදීම
2. දෙවියන්ගේ සැකදුරු කිරීම
3. අභිධර්මය මෙනෙහි කිරීම
4. අනිමිසලෝචන පූජාව

09) සාරිපුත්ත මොග්ගල්ලාන අගසව්වරුන්ගේ ගිහිකල නාමයන් නම්,

1. සංජය හා කෝලිත
2. තපස්සු - භල්ලුක
3. භද්දිය අනුරුද්ධ
4. උපතිස්ස - කෝලිත

10) ජේතවනාරාමය තනවා පූජා කරන ලද්දේ,

1. අනාථපිණ්ඩික සිටුතුමා
2. විශාකා සිටුදියණිය
3. කොසොල් රජතුමා
4. බිම්බිසාර රජතුමා

11) තුරිත චාරිකා යනුවෙන් අදහස් වනුයේ

1. බුදුරජාණන් වහන්සේ භික්ෂූන් සමග චාරිකාවේ යෙදීමකි
2. බුදුරජාණන් වහන්සේ ප්‍රදේශයෙන් ප්‍රදේශයට යෑමයි
3. බුදුරජාණන් වහන්සේ ඉක්මන් නොවන චාරිකාවක යෙදීමයි
4. කිසියම් පුද්ගලයෙකු හෝ පිරිසක් වෙනුවෙන් විශේෂයෙන් දහම් දෙසීමට වැඩමවීමයි.

12) බුදුරජාණන් වහන්සේ රාත්‍රිකාලය බෙදා දක්වා ඇත්තේ

1. පෙරයම් කිස - පෙර බත් කිස හා පසුබත් කිස යනුවෙනි
2. මැදියම් කිස - පෙරබත් කිස හා පසුබත් කිස යනුවෙනි
3. පසුබත් කිස - පෙරයම් කිස හා පැසුළුයම්කිස යනුවෙනි
4. පෙරයම් කිස - මැදියම් කිස හා පැසුළුයම් කිස යනුවෙනි

13) තෙරුවන්ගේ ගුණ ප්‍රමාණය නම්,

1. විස්සකි
2. හයකි
3. දහයකි
4. විසිහතරකි

14) 'විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය' නම්,

1. විඤ්ඤාණය අනන්ත යැයි සැලකීමෙන් ලැබෙන ධ්‍යානය
2. අවකාශය අනන්ත යැයි සැලකීමෙන් ලැබෙන ධ්‍යානය
3. හිස්බව මෙනෙහි කිරීමෙන් ලැබෙන ධ්‍යානයයි
4. ඉතා සියුම් වුහෝ දැනීම් නැති තත්ත්වයකින් යුත් ධ්‍යානයයි.

15) විපස්සනා භාවනාවේ ඵලය නම්,

1. සිත එක අරමුණක වීමයි
2. කාමච්ඡන්දය දුරුවීමයි
3. ත්‍රිලක්ෂණය අවබෝධය තුලින් නිවනට ළගාවීමයි
4. ධ්‍යාන සිත් උපදවා ගැනීමයි

16) දුටුගැමුණු රජතුමා කරවූ වෙහෙර විහාර ගණන

1. විසිපහක් පමණ වේ
2. අසූහතරක් පමණ වේ
3. හැට අටක් පමන වේ
4. හැත්ත අටක් පමන වේ

17) 'සබ්බ පාපස්ස අකරණං' මෙහි තේරුම නම්,

1. මෙය බුද්ධ ශාසනයයි
2. සියලු පව් දුරු කරන්න
3. සියලු පව් කමා කරගන්න
4. නොපමාව කුසල් සම්පාදනය කරන්න.

18) කරණීය මෙත්ත සූත්‍රය තුළ අඩංගු වන්නේ,
1. මෛත්‍රිය පැතිරවීමයි
2. දෙවියන්ට පින්දීමයි
3. කටයුතු සාර්ථකව කර ගැනීමයි
4. අමනුෂ්‍යයන්ට ප්‍රියවීමයි

19) 'අවෙච්චප්පසාදය' යනු
1. තෙරුවන් කෙරෙහි වන පැහැදීමයි
2. මෛත්‍රිය පැතිරවීමයි
3. තෙරුවන් කෙරෙහි අප්‍රසාදයයි
4. මගඵල අවබෝධ කරගැනීමයි

20) බුදුන්වහන්සේගේ ප්‍රථම උදාන පාඨය
1. අග්ගෝ හමස්මිං ලෝකස්ස
2. අනේක ජාති සංසාරං
3. හේතුපටිච්චං සමභූතං
4. රාහුලෝජාතං බන්ධනං ජාතං

(ලකුණු 20x2)

## 2 කොටස

* කෙටි පිළිතුරු සපයන්න.

01) අ) කර්මය සඳහා අදාළ වන ගාථා පාඨය ලියා දක්වන්න.
ආ) 'අව්‍යාපාදය' යනු කුමක්ද ?

02) අ) ත්‍රිශික්ෂාව නම් කරන්න.
ආ) ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ශීලය අයිති අංග නම් කරන්න.

03) අ) 'සබ්බේ සංඛාරා අනිච්චාති' මෙම පාඨයේ අදහස ලියන්න.
ආ) බුදුදහමට අනුව ලෝකයේ ස්වභාවය කුමක්ද ?

04) අ) කාමලෝක කීයද ?
ආ) අරූපාවචර ධ්‍යාන සිත් කීයද ?

05) අ) අටලෝදහමට මුහුණ දුන් අවස්ථාවක් සඳහන් කරන්න.
ආ) නිර්වාණ මාර්ග දෙක නම් කරන්න.

06) අ) නීවරණ ධර්ම කීයද ?
ආ) ඒ මොනවාද ?

07) 'මාගේ මේ ව්‍යායාමය රජසැප පිණිස නොව බුද්ධ ශාසනයේ චිර පැවැත්ම උදෙසායැ'
අ) මෙම ප්‍රකාශය කළේ කව්ද ?
ආ) එතුමා බුද්ධ ශාසනයට කළ සේවයක් සඳහන් කරන්න.

08) අ) සත්සතිය නම් කරන්න.
ආ) එක් සතියක වූ වැදගත් සිදුවීම් ලියන්න.

09) අ) අකුසල මූල 3 නම් කරන්න.
ආ) ඔබ පාසලේ දී කළ යහපත් ක්‍රියා 2 ක් ලියන්න.

10) ආ) පන්සලක ගොස් වැදිය යුතු ස්ථාන පිළිවෙලින් නම් කරන්න.
ආ) පන්සල තුළ ඔබ නොකල යුතු ක්‍රියා 2 ක් ලියන්න.

(ලකුණු 20)

## 3 - කොටස

* ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙහිම ලියන්න.

01) 1. දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කළේ .................................................. ටයි. එය අසා .......................................... සෝවාන් විය. සියලු පස්වග මහණුන් රහත්ඵලයට පැමිණියේ .......................................... අසායා. එය .......................................... පොහෝ දිනයකි.

2. අභිනිෂ්ක්‍රමණය කළ සිදුහත් කුමරුට සිවුරුපිරිකර පූජා කළේ .......................................... බ්‍රහ්මයාය. .......................................... බ්‍රහ්මයා සියලු සතුන්ට ධර්මය දේශනා කරන ලෙස ආරාධනා කරන ලදි.

3. දුරු කළ යුතු අන්තදෙක නම් .......................................... හා .......................................... යි. කෙලෙස් යනු සිතේ පවතින .......................................... සිතුවිලිය. සම්මා දිට්ඨිය නම් .......................................... යි.

4. "හොඳින් සිතා කරුණු විමසා කයින් වචනයෙන් සිතෙන් ක්‍රියා කරන්න. තමාටද අනුන්ටද තමා හා අනුන් යන දෙකොටසටම ද හානිවන ක්‍රියා නොකරන්න. තමාට අනුන්ට හා ඒ දෙකොටසටම යහපත ගෙන දෙන ක්‍රියාපමණක් කරන්න."

මේ ප්‍රකාශය .......................................... විසින් .......................................... අමතා කරන ලද්දකි. ධර්මය තුළින් බුදුරදුන් දැකීම හා බුදුරදුන් තුළින් ධර්මය දැකීම යනු .......................................... හා .......................................... ගුණය යනුවෙන් හැඳින්වේ.

(ලකුණු 40)